**ආයුර්වේද වෛද්‍ය සභාව - 2013**
------------------------------------

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11-21 දක්වා වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල්පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
--------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වනකොටස් 11(1)(ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් තෝරා පත් කරනු ලැබූ සමාජිකයින් 3 දෙනෙකු සභාවේ සංයුතියට ඇතුළත් විය යුතු වුවද, වෛද්‍ය සභාවට ලියාපදිංචි වෛද්‍යවරුන් කිසිවකු පත් කර නොතිබුණි. මේ පිළිබඳ ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තා මඟින් ද පෙන්වා දී තිබුණි. |
| (ආ) | 2005 ජුලි 05 දිනැතිඅංක 14/13/08 (3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 05 කට වරක් ලියාපදිංචි වූ වෛද්‍යවරුන්ගෙන් ලියාපදිංචි ගාස්තුවක් අය කර ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය I XII වන පරිච්ඡේදයේ 36 වගන්තිය | නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.132,200 ක ආපදා ණය සහ රු. 1,000 ක උත්සව අත්තිකාරම් අය කර ගැනීමකින් තොරව, වර්ෂ 3ක් සඳහා වැටුප් රහිත විදේශ අනුමත කර විදේශ නිවාඩු කර විදේශ ගත වී තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 169 | නිශ්කාෂණය නොවූ රු.8,745 ක් වටිනා මුදල් ඇණවුම් 25ක මුල් පිටපත් කාර්යාලයේ නොතිබුණි. |
| (ඉ) | DMS/E3/38/4/241/1-(vol)1 අංක දරන 2013 ජුනි 04 අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ දිනැති මුදල් හා ක්‍රම සම්පාදන ලිපිය | වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට මාසයකට රු.1,800ක උපරිමයකට යටත්ව දිරිදීමනා ගෙවීම අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා නිලධාරීන් 11ක් වෙනුවෙන් රු.112,300 ක දිරි දීමනා ගෙවා තිබුණි. වාර්ෂික අයවැය ලේඛණය මඟින් දිරිදීමනා ගෙවීමට මුදල් වෙන් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,575,270 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.96,820 ක් විය. මුළු ආදායම ඉකුත් වර්ෂයේ ආදායමට වඩා සියයට 33 ක් හෙවත් රු.2,362,405 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ ඉහළ යාම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලියාපදිංචිය යාවත්කාලීන කර නොමැති වෛද්‍යවරුන් මේ වන විට ජීවත්ව සිටින්නේද යන්න පිළිබඳව තහවුරුකර ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් ආයුර්වේද වෛද්‍යවරයෙකුට සමාජයේ පවතින විශ්වාසනීයතාවය යොදාගනිමින් හා ඔවුන්ගේ ලියාපදිංචි අංක භාවිතා කරමින් වංචාකාරී පුද්ගලයන්ට වෛද්‍ය වෘත්තියේ යෙදිය හැකිවීම, වෛද්‍ය සහතික නිකුත් කිරීම වැනි විවිධ දූෂණ ක්‍රියා සිදු නොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) පහත සඳහන් අනුකමිටු 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ක්‍රියාත්මක නොවූ බැවින් මෙම අනු කමිටු වලින් අපේක්ෂිත කාර්යය ඉටු වී නොතිබුණි.

i. පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ විෂය නිර්දේශය සංශෝධනය කිරීමේ අනු කමිටුව.
ii. අභාවයට යන පාරම්පරික විදුම් පිළිස්සුම් වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීමේ අනු කමිටුව.
iii. පශු වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම පිළිබඳ අනුකමිටුව.
iv. දේශීය පාරම්පාරික දැනුමට අදාළ දත්ත මූලාශ්‍ර පිහිටුවීමේ කමිටුව.
v. දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘත්තිය සංවර්ධන අනුකමිටුව

(ඇ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙකක ලියාපදිංචි වෛද්‍යවරුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව.**

| | **2013** දෙසැම්බර් **31** දිනට | **2012** දෙසැම්බර් **31** දිනට | **2011** දෙසැම්බර් **31** දිනට |
|---|---|---|---|
| <u>සර්වාංග</u> | | | |
| උපාධිධාරී | 2,190 | 2,109 | 1974 |
| ඩිප්ලෝමාධාරී | 5,156 | 5,024 | 4929 |
| පාරම්පරික | 5,385 | 5,340 | 5295 |
| <u>පාරම්පරික විශේෂ</u> | | | |
| සර්ප විෂ | 3,494 | 3,469 | 3442 |
| | 2,229 | 2,182 | 2138 |

| | | | |
|---|---|---|---|
| කැඩුම් බිඳුම් | 627 | 626 | 625 |
| අක්ෂි රෝග | 536 | 529 | 528 |
| චර්ම රෝග | 364 | 360 | 355 |
| ගෙඩි වණ | 181 | 180 | 180 |
| ජලභීතිකා | 82 | 80 | 78 |
| දැවුම් පිළිස්සුම් | 151 | 149 | 144 |
| මානසික | 07 | 07 | 07 |
| විදුම් පිළිස්සුම් | 658 | 658 | 658 |
| වෙනත් | -------- | -------- | -------- |
| | 21,060 | 20,713 | 20,353 |
| එකතුව | | | |

අක්ෂි රෝග, චර්ම රෝග, ගෙඩිවණ, දැවුම් පිළිස්සුම්, ජලභීතිකා හා මානසික යන පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වැඩිවී තිබුණේ 17 කින් වන අතර, විදුම් පිළිස්සුම් සහ වෙනත් පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් ලියාපදිංචි වීමක් 2010 වර්ෂයෙන් පසු සිදු වී නොතිබුණි.

(ඇ) පසුගිය වසර පහක එක් එක් වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම පහත දැක්වේ.

| වෛද්‍යවරුන් | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| උපාධිධාරී | 137 | 135 | 162 | 161 | 190 |
| ඩිප්ලෝමාධාරී | 76 | 95 | 89 | 91 | 72 |
| පාරම්පරික | 45 | 45 | 30 | 75 | 48 |
| පාරම්පරික විශේෂ | 90 | 85 | 68 | 148 | 165 |
| | ------ | ------ | ----- | ------ | ------ |
| | 348 | 360 | 349 | 475 | 475 |
| | === | ==== | === | ==== | ==== |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009 වර්ෂයට සාපේක්ෂව 2010 සිට 2013 දක්වා, පාරම්පරික විශේෂ, හා උපාධිධාරී වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අඩු වී තිබුණ අතර 2009 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී එය පිළිවෙලින් සියයට 45 කින් හා සියයට 28 කින් අඩුවී තිබුණි.

(ii) ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලියාපදිංචිය ක්‍රමයෙන් වැඩිවී තිබුණද, 2013 වර්ෂයේදී නැවත අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී දේශිය හස්ති වෛද්‍යවරුන් ලියාපදිංචි වී නොතිබුණද, කාර්ය සාධන වාර්තාවේ 05 ක් ලෙස දක්වා තිබුණි.

(ඊ) පසුගිය වර්ෂයේ "හෙළවෙද රුවනාර" වැඩසටහන් 04ක් පවත්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 26 දින රු.480,000 ක් වැයකර වෛද්‍ය සහතික පොත් 10,000 ක් මුද්‍රණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ශේෂය 10,236 ක් විය. පහත

දත්ත අනුව 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පොත් නිකුත් කිරීම් ඉතා පහල මට්ටමක පැවති අතර අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව මුද්‍රණය කර තිබූ බව නිරීක්ෂණය විය.

| වර්ෂය | නිකුත් කරන ලද වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව |
|---|---|
| 2011 | 1181 |
| 2012 | 1256 |
| 2013 | 840 |

(ආ) 2013 දෙසැම්බර් 23 දින පැවති වෛද්‍ය සභා රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා රු.54,000 ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන තිබුණි. එම රැස්වීමට සහභාගී නොවූ සාමාජිකයන් 4 දෙනෙකුට අදාළ පැමිණීමේ දීමනාව වූ රු.14,400 වෙනුවට රු.10,800 ක් පමණක් අත්තිකාරම් පියවීමේදී ගෙවා තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

1998 වර්ෂයේ දී මිලදී ගන්නා ලද වටිනාකම රු.40,780 ක් වූ සිසිල් ශීතකරණය විගණිත දිනය වූ 2014 ජනවාරි 24 දින වන විට ද නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | වාර්ෂික වැටුප | අතිකාල | මුළු මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| ලේඛකාධිකාරී | 01 | 01 | 129,992 | - | 129,992 |
| ක.සහකාර | 09 | 09 | 2,771,777 | 251,470 | 3,023,247 |
| කා.කම්කරු | 02 | 02 | 376,696 | 21,674 | 398,370 |
| | 12 | 12 | 3,278,465 | 273,143 | 3,551,609 |

කාර්ය මණ්ඩල පුරප්පාඩු නොපැවතුනද නිලධාරීන් අතිකාල සේවයේ යෙදෙන බව නිරීක්ෂණය විය.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කල යුතු කාර්යයන් 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමණාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.4 විගණන කමිටු**

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ වියදම්, අයවැයගත වියදම් සමඟ සැසඳීමේදී සැලකියයුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අතිකාල ගෙවීම්
(ආ) පැමිණීම
(ඇ) නිවාඩු
(ඈ) වාහන කුළියට ගැනීම